# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2481/23 - 2026 මාර්තු මස 27 වැනි සිකුරාදා - 2026.03.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : KDS/KUN/04/07/16/04/112.
*කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/18/2021/WS/357.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 701, ඉහළවෙල ග්‍රාම නිලධාරි වසමේ කෙන්ගල්ල ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2025.12.12 දිනැති කැඩැස්තර සිතියම් අංක 320854 දරන පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන "කොලොන්ගහවත්ත" නමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0139ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස :

**කැබලි අංකය 01**

ඉඩමේ නම: කොළොන්ගහවත්ත; හිමිකම් කියන අය සහ නම් සහ ලිපිනයන්: ඩී. ජී. එම්. යූ. ඩී. එස්. දොලහමුන, අංක 01, අක්කර දෙක කොටස, කොළොන්ගහවත්ත, කෙන්ගල්ල; ප්‍රමාණය: හෙක්. 0.0139.

මායිම්

උතුරට: මු. පි. මහ 2681 හි 2 වැනි බිම් කැබැල්ල සහ පාර;
නැගෙනහිරට: මු. පි. මහ 2681 හි 2 වැනි බිම් කැබැල්ල;
දකුණට: මු. පි. මහ 2681 හි 2 වැනි බිම් කැබැල්ල සහ පාර;
බටහිරට: මු. පි. මහ 2681 හි 2 වැනි බිම් කැබැල්ල

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.06.16 දින පෙ. ව. 10.00ට කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2026 ජූනි මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්

එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**කේ. එස්. ඩී. දිසානායක,**
ප්‍රාදේශීය ලේකම්,
කුණ්ඩසාලේ.

2026 මාර්තු මස 16 වැනි දින,
කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0213

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/2/2015/PT/223.
*මගේ අංකය* : RUW/LAN/ACQTN/A2/131.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*මහජන කටයුත්ත කුමක්ද යන වග* - ගලපිටමඩ තැපැල් කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ඉඩම් අත්කර ගැනීම

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එගොඩපොත පත්තුව, අංක 99 බී ගලපිටමඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගලපිටමඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ කැඩැස්තර සිතියම් අංක 610418 කලාප අංක 03 පත්‍ර අංක 01 හා 2026.01.08 දිනැති පිඹුරේ සවිස්තරව දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0895ක් වූ පහත කැබලි අංක 1 සිට 4 දක්වා වන බිම් කැබලි :

01. **කැබලි අංකය 01**
ඉඩමේ නම: රුප්පෙගාව වත්ත; හිමිකම් පාන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.0682.

02. **කැබලි අංකය 02**
ඉඩමේ නම: රුප්පෙගාව වත්ත; හිමිකම් පාන්නා: ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය; ප්‍රමාණය: හෙක්. 0.0198.

03. **කැබලි අංකය 03**
ඉඩමේ නම: රුප්පෙගාව වත්ත; හිමිකම් පාන්නා: ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය; ප්‍රමාණය: හෙක්. 0.0011.

04. **කැබලි අංකය 04**
ඉඩමේ නම: රුප්පෙගාව වත්ත; හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0004.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026 සැප්තැම්බර් මස 23 වන දින පෙ. ව. 09.30ට රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2026 සැප්තැම්බර් මස 09 වැනි බදාදා දිනට මත්තෙන් ඒ ඉඩම/පරවශතව සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම / පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු හා වෙනත් ලියවිලි පරීක්ෂණ දිනයේදී ඉදිරිපත් කළ යුතුය.

**එච්. ඩී. එස්. එන්. හෙට්ටිගේ,**
ප්‍රාදේශීය ලේකම්,
රුවන්වැල්ල.

2026 මාර්තු මස 17 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0214

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.